වූ අතර මෙම කල්ලි දෙක ''මරුවුල්ලිය'' සහ ''සුදලිය'' වශයෙන් නම් විය. සෝජන සිටු කුමාරුවන් වැනි සටන් හරබ විරුවන් බිහිකළ සිංහලයේ වැවකි මෙම ගුරුකුල දෙක අතර එම විරුවන් එකිනෙකා අභියෝග කෙරෙමින් සටන් පැවැත්විණි. මෙම සටන් පවත්වන ස්ථානය නරඹන්නන්ටද ඉඩකඩ සළසා දුන් කුඩා දෝණියක ආකාර වූ පිටියකි. එය ''ඌරා ළිඳ'' නම් විය.

අපගේ මුතුන් මිත්තන් ගේ දවස පටන් දෙපිලකට බෙදී ක්‍රීඩාවක් ලෙසින් පැවතගෙන ආවද, ක්‍රීඩාවේ ඇති භයානක කම නිසා දනුන් නැසී යාමට ක්‍රීඩාවම

අං පටලවා ගැනීම

''ඇගේ මැඩිල්ලේ' කය හුරුකරවා සෝජන සිටුවරු වදන මෙසේ ''මරුවල්ලිය' හා ''සුදලිය' ඇත්තෝ අංගම හටනකි - ඌරා ළිඳේ...

මුතු මිත්තන් දා පටන් පැවත ඒ දෙපිල බෙදීලා කෙළි ලෙල්ලම් දෙපිල් බෙදීලා 'මරුකිලි' ශිල්පේ උනුන් නැසී - දන් නෑ අංගමේ.

නිදහස ලත් දා පටන් ගලා ඒ දෙපිල් බෙදීලා පටු හැඟුමන් කිරැළ පතාලා ගෙළ ජන දීපේ උනුන් නැසූ දා කෝ ගෙළයන්?

අපගේ ලෝක ඉතිහාසයේ පොත් පිටු අතරින් කියැවෙන විශේෂ සටන් ක්‍රමයකි අංගම් සටන් ක්‍රමය. අංගම් සටන් පුහුණුවන ආයතනය හෝ ස්ථානය හඳුන්වනු ලැබුයේ ''ඇගේ මැඩිල්ල'' නමිනි. මෙවන් සටන් මධ්‍යස්ථානවල ශාරීරික අභ්‍යාස කරවමින් රටට දායාද කළ අංගම් සටන් ශූරයින් අතර කෙළ පැමිණියෙකි ''සෝජන'' නමැති සිටු කුමරා. එකලද, මෙම අංගම් හටන්, ප්‍රගුණ කරවන්නන් පුධාන ගුරුකුල දෙකක් යටතේ නේතු විය. මරු කැඳවන නිල බලා පහර එල්ල කිරීමේ ශිල්පයක් වූ ''මරුතිල'' ශිල්පය වඩාත් භයානක විය. උනුන් නැසීයාමත් සමගම අද වන විට අංගම් හටන් ශිල්පයද අභාවයට ගොස් ඇත්තේ ය. ශ්‍රී ලංකාව නිදහස ලද දා පටන් මේ වනතුරුම අප අත් විඳින්නේ රටේ පාලනය තමැති කිරැළ වෙනුවෙන් දෙපිල බෙදී සටන් වදින ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂයයි. දේශපාලන ක්‍රීඩාවේ යෙදී උනුන් නසා ගගගය යන මේ ගමනේ කෙළවර කොතැනකදැයි සිතාගනු නොහේ, එදා දොහතුර බිහි වූ සහ බිහිවන පටු හැඟුමන් නිසාමෙන් ඉදිරියේදී ශ්‍රී ලාංකිකයින් මතු නොව ශ්‍රී ලංකා ධරණී තලය පවා සොයාගැනීමට අපහසු වනු ඇත. ස්වභාවධර්මයාද ඊට හවුල් වී ඇති සෙයකි හැඟෙනුයේ. ඉසිබුවකට, අස්වැසිල්ලකට හෝ නෑ මිතුරන් සොයා මළ රටටය කියා අපහට යාමට සිදුවන්නේ කිනම් වූ දේශයකටද? අංගම් සටන් ශිල්පීන් ඉතිහාසයෙන් අපට කියාදුන් කදිම පාඩමකි මේ.

ජායා : බුද්ධිනී ඒකනායක
සේයා සිසිර දිසානායක



සුවඳැති කුසුමක්

ශ්‍රීලාල් කටුනායක අපේ හිතවතා හිඳපදානය කළ කෞමද කුසුමි සිනමා පටය නරඹා ශාලාවෙන් ඉවතට ආවෙ සතුටකින්. පසය හත අටක් දිග වෙලි තාටකයක් පය දොකටක කෙටි කිරීමේදී ඇති වන යම් යම් අඩුපාඩු තිබුණත් ශ්‍රීලාල්ගේ උත්සාහය පසසමි ලැබිය යුතු එකක්.

මට හිතෙන විදිහට කැමරා ශිල්පියෙකු ලෙස ඔහු දක්වා ඇති ප්‍රතිභාව ඉතා ඉහළයි. සියලුම රංග ශිල්පීන්ගේ ශිල්පිතියන්ගේ නොමඳ දායකත්වයත් කෞමද කුසුමි පුබුදන්නට ඉහළින් ම දායක වෙනවා. ගයනා කටුනායක දියනිය, අජිත් සිල්වා, ගාමිණී රණසිංහ ඇතුළු මෙල්බන් රංග ශිල්පීන් ගේ දායකත්වයත් ඉතා ඉහළයි.

ශ්‍රීලාල් කටුනායක දුර ගමනක් යන බව විශ්වාසයි. මේ සටහන ඒ ගමනට සුබ පතන්නයි. සුබ ගමන් මිත්‍රයා.

අපූරුයි දරුවනි

අපේ දරු දැරියන් අපේ සංස්කෘතිකාංග කෙරෙහි දක්වන උදාසීන බව වැඩිහිටි බොහෝ අයගේ මැසිවිල්ලට ලක්වුණ කාරණයක්ය කියන එක රහසක් නෙවෙයි. අපේ බොහෝ දරුවන් සිංහල ගීත ගයනවා තියා අහන්නවත් කැමති නැහැර.

මේ අතරේ එක්තරා දියනියන් දෙදෙනෙක් සිංහල ගී ප්‍රසංග ඒවිදියකට පානා පෙළපතර ගැයන නොලියා ම බැහැර. කැමරන් කොළඹිගේ සංගීතවේදියාගේ තරංගා සංගීත කණ්ඩායමේ ළාබාල සාමාජිකාවන් දෙනෙනා, දිළිති ප්‍රනාන්දු සහ වීණා කෘෂ්ඳරගම දියනියන් දෙදෙනා ගැයන බොහෝ අය කතා වන හැටි මට ඇහුණා. දිළිති කී බෝඩයෙනුත් වීණා බටහලාවෙනුත් මවක අපේ ගී රස ඇසට කඳුලක් නංවා ගන්නෙන නැතිව විඳින්නෙ කොහොමද?

අපූරුයි දරුවනේ.. මේ සමාජයේ අපේ දේ අගයන හැම දෙනාගෙම ආශිර්වාදය ඔබ දෙදෙනාට හිමිවෙනවා.

උත්තරයක් හොයා ගනිමුද?

තාත්තෙකුයි දුවෙකුයි ශ්‍රී ලාංකික කඩයකට ගියා. කඩේ සෙනග. දෙන්නා පැත්තකට වෙලා තමන්ගෙ වාරය එනකල් බලා හිටියා.

ඉස්සරහින්ම හිටියෙ සිංහල කාන්තාවක් සහ ඇගේ සැමියා. කාන්තාව සිංහල වීඩියෝ කැසට් පටි තෝරමින් ඉන්නවා. ඒ අතරේ සැමියාගෙන් ඒ සිංහල වීඩියෝ පිළිබඳව හොයෙකුත් ප්‍රශ්න අහනවා. ඔක්කොම ප්‍රශ්න ඉංග්‍රීසියෙන්. ඒ හැම ඉංග්‍රීසි ප්‍රශ්ණයකටම සැමියා උත්තර දෙන්නෙ සිංහලෙන්. බිරඳගේ ඉංග්‍රීසි කතාව ගැන සැමියගෙ නොරිස්සුම පැහැදිලිවම පෙනුණා... එයින් අවධේරයයට පත් නොවන කාන්තාව නොකඩවාම සිංහල වීඩියෝ පිළිබඳ ඉංග්‍රීසි ප්‍රශ්ණාවලිය ඉදිරියටම ගෙන යනවා.

තාත්තයි දුවයි බඳු අරන් ආපහු එන අතරදී දුව තාත්තගෙන් මෙහෙම අහනවා.

"තාත්තා අපට හැම තිස්සෙම කියනවා සිංහලෙන් කතා කරන්න කියලා.. ඒත් අර නැන්දා මොකද අර විදිහට සිංහල වීඩියෝ ගැන ඉංග්‍රීසියෙන් කතා කරන්නෙ.. එයා සිංහල වීඩියෝ බලන නිසා එයාට සිංහල පුළුවන් වෙන්න ඕනෙත.. අනෙක් එක එයාගෙ මහත්තයා සිංහලෙන් උත්තර දෙද්දිත් එයා මොකද අර තරම් ඉංග්‍රීසියෙන් ම කතා කරන්නෙ..?"

තාත්තා මොනවා කියන්නද..

"ඒ වගේ අය ගැන හිතන්න එපා.. .. දුව සිංහලෙන් කතා කරන්න.." තාත්තා කිව්වා.

මේ සටහන ලියද්දී මට මතක් වුනේ ඊයෙ මම මගේ පවුලේ වෛද්‍යවරිය හම්බුවන්න ගිය ගමන. අය මුස්ලිම් කාන්තාවක්. ගෙදරින් පිටත් වෙද්දි මගේ බිරිඳ සිංහලෙන් ලියූ තුන්ඩුවක් මගේ අතට දුන්නේ මේ බෙහෙත් ටිකත් ලියවාගෙන එන්න කියලයි. මම ඒ සිංහල තුණ්ඩු කෑල්ල මගේ වෛද්‍යවරියට දුන්නා. ඈ එය බලා බෙහෙත් තුණ්ඩු ලියන හැටි මම බලා හිටියා.

"තවමත් සිංහල අමතක නැහැ නේද..?" මම ඇහුවා. අය සිනාසුණා.

"පිස්සු කතා කරනවද..? එහෙම සිංහල අමතක වෙනවද..?" අය ඇසුවා.

මහාසාර

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික පුජාව තුළින් ඉදිරිපත් වන වේදිකා කිරීමාණ අතර සුවිශේෂී වූ කිරීමාණයක් දැක ගන්න අවස්ථාව ලැබීම සතුටට කරුණක් ඒ ජය ශ්‍රී වන්දුජිත් කලාකරුවාගේ මහාසාර මෙල්බන් නිෂ්පාදනය

මෙවන් කිරීමාණයක් ඉදිරිපත් කිරීමේ දී දරන්නට වන කැපවීම පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතු නැහැ ඒ කැපවීමේ අවසන් ඵලය අපට පෙන්වා දෙන්නේ උත්සාහ ගන්නේ නම් මේ පුරවරයේ කලාකරුවනට කළ නොහැකි දෙයක් නැති බවය

මේ කාර්යයේදී ජය ශ්‍රී ට මෙපුර ගුලු නිළියන් ගෙන් ලැබී ඇති දායකත්වය ප්‍රශංසනීය යි රත්නා ගාමිණී විපුල් නුවන් ජගත් රෝහණ හිෂාමලි ශ්‍රීනාත් හේමන්ත රශ්මි චන්තක හා වාසනා යන නළු නිළියන්ටත් ගායකයෙන් හා වාදකයෙන් දායක වූ සැමටත් රසිකයෙකු ලෙස අපේ ස්තූතිය පුද කරන්න කැමතියි

මෙපුර ගී

ගිය මාසෙ මෙපුර ගී පිළිබඳ ලියූ සටහන ට උණ පුරණයක් මේ. මෙපුර ගී ප්‍රසංගයට සහය දුන් අය අතර ලක්ගඬේ ගාමිණී ෆොන්සේකාත් 3ZZZ ගුවන් විදුලියේ පැතුම් නිලකසිරිත් සිටි බව දැනගන්නට ලැබුණා. ඔවුන්ටත් ස්තූතියි.

මෙපුර ගී ප්‍රසංගය මගේ ප්‍රසංගයක් නෙවෙයි. අප කළේ එයට උදව් කිරීමක් පමණයි. මෙපුර ගී ප්‍රසංගයට සහය දුන් අය වෙනුවෙන් ස්තූති කිරීම මට අයිති රාජකාරියක් නෙවෙයි. එය ඒ ප්‍රසංගයේ සංවිධායකයගේ වැඩක්. ගිය මාසෙ මං කළේ ඒ ප්‍රසංගයට සහය දෙන අතරේ මගේ හිතට වැදුන හිතට දැනුණ දෙයක් කළ හතර දෙනෙක් පිළිබඳ සටහනක් ලිවීම පමණයි. එය ස්තූති ප්‍රකාශයක් නෙවෙයි කියලත් යටින් ලිව්වෙ ඒ හිසයි..

එක්තරා මිත්‍රයෙකු සමග අන්දරේ ඉතා කිටිටුවෙන් ආශ්‍රය කළා. මිත්‍රයාට කොතරම් විශ්වාස කළා ද යත් තම පණ මෙන් ආරක්ෂා කළ වටිනා කියන පුස-කොල පොත් ආදියද ඔහුට දුන්නා. මිත්‍ර කම නිසා.. පසුව මිත්‍රයා අන්දරේ සමග අමනාප උණා.

දවසක් අන්දරේ එන විට අන්දරේ දැක මිත්‍රයා ඉවත බලාගත්තා. මේ දුටු අන්දරේ මෙන් මෙහෙම කිව්වා.

තුටු දේපා කරවන මට නොවන	උපා
දුටු කෝපා වඩවන කෝප අපට	එපා
තොපට එපා නම් එක වාරයක්	අපා
අපට එපා පන්සිය වාරයක්	තොපා

ශ්‍රීධර බුවනෙක

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

අන්තර්ජාලයෙන් කියවන්න

www.sannasa.net